* සියලු ම හිමිකම් ඇවිරිණි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 අගෝස්තු

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) **දී ඇති කාලය** : කියවීම සඳහා විනාඩි 15
: උත්තර ලිවීම සඳහා පැය 03
(2) **සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.**
(3) ඉලලුම් කරන ලද **මාධ්‍යයෙන් එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
(4) ගණනය කිරීම් සහ පෙර වැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.
(5) වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.
(6) අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණේ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයකම් කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.
(7) ලකුණු 100.

**සැකසුම :- ජීවන්ත පෙරේරා**
[B.Sc (Acct) Sp.,ACA]

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ලංකාව තුළ සමාගම් සිය වෙළඳ ව්‍යාපාර කටයුතු විවිධ ස්වරූපයෙන් සිදු කරනු ලබයි. සමාගම් ශ්‍රී ලංකාව තුල මෙන්ම ඉන් බැහැරව ද සෘජුව මෙන්ම වක්‍ර ක්‍රමයෙන් උපයෝගි කරගෙන ද සිය ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි.

I. නියෝජ්‍යත්ව න්‍යාය හා භාරකාර න්‍යාය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)
II. සංවිධානයකට බලපාන බාහිර පරිසර සාධක කවරේද? එම සාධක පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

සීමාසහිත මැඩේරා සමාගම කේක් නිෂ්පාදනය කර අපනයනය කරන සමාගමේ ගණකාධිකාරිවරයා ඔබ වේ. වර්තමානයේ පවතින Covid (19) වසංගතය නිසා පසුගිය කාර්තු දෙක තුළ සැලකිය යුතු අලාභයක් දැරීමට ව්‍යාපාරයට සිදු විය. අවදානම් විශ්ලේශණය කර ඒ පිළිබඳ වාර්තාවක් ලබාදෙන මෙන් ඔබත් ඉල්ලා සිටී.

I. ව්‍යාපාරය මුහුණ දී ඇති අවදානම් නම් කළමනා කරණ ආකෘතිමය රාමුව නිර්දේශ මත සිදුකරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (අවදානම් ඊට ප්‍රතිචාර දැක්වීම් හා අවධානම් අවම කර ගැනීමට භාවිතා කරන ශිල්ප ක්‍රම)

(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

සමාගමක් විසින් පිළියෙල කරන්නා වූ මූල්‍ය ප්‍රකාශන ඒවා භාවිතා කරන පාර්ශවයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම කෙරෙහි තෙවන පාර්ශික ගේ සහතික වීමක් විගණන වාර්තාවක් හරහා ඉදිරිපත් කරනු ලබයි. මෙය සහතිකවීමේ කාර්යභාරය තුළින් සිදු කරනු ලබයි.

I. සහතිකවීමේ කාර්යභාරය යන්න කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

II. සාධාරණ සහතිකවීමක් සීමිත සහතිකවීමකින් වෙනස් වෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 03)
(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

කාර්යභාරය හා එහි කාර්යය සාධනය, කාර්යක්ෂමතාවයේ අඛණ්ඩතාවය අධීක්ෂණය හා සමාලෝචනය යනු එක් එක් කාර්යභාරයන්වල තත්ත්ව පාලනය කිරීමේදී සලකා බැලිය යුතු වැදගත්ම අංශ තුනකි.

I. තත්ත්ව පාලන පද්ධතියක අරමුණු කවරේද? (ලකුණු 02)

II. මූල්‍ය ප්‍රකාශනයක විගණනයකට අදාල තත්ත්ව පාලන අවශ්‍යතා කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 03)
(මුළු ලකුණු 05)

A කොටසේ අවසානය

## **B කොටස**

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත උදය ට්‍රේඩිං පුද්ගලික සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ විගණනය සිදු කිරීම කරනු ලබන ගමගේ ඇසෝසියේට් විගණන ආයතනය විගණන ශ්‍රේෂ්ඨයා ඔබ වේ. විගනණය භාරකරු විසින් අදාළ සමාගම පිලිබඳ විගණන වාර්තාව **2021 මාර්තු 31** දිනට මූල්‍ය තත්ත්ව ද එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපණය නොකරන බව සෑම ප්‍රමාණාත්මක කරුණු අතින්ම සාධාරණ ලෙසයි ඉදිරිපත් කර නැති බව යන ලෙස මතය ප්‍රකාශ කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

I. ඉහත සඳහන් කරන ලද ප්‍රකාශයට අනුව එම මතය කුමක් විය හැකිද? (ලකුණු 02)

II. එලෙස ප්‍රකාශ කිරීමට අදාළව මූල්‍ය තත්ත්වයට එදිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පැවතිය හැකි යැයි අපේක්ෂා කරන තත්ත්වයන් සැකවින් දක්වන්න. (ලකුණු 06)

III. විගණන මත ප්‍රධාන වශයෙන් කෙසේ හඳුනා ගන්නේ ද? (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

සීමාසහිත **XYX සමාගම** මිහිරි කේක් සහ රසකැවිලි අලෙවි කරන සමාගමකි. 2021/03/31 න් අවසන් වර්ෂය සඳහා සමාගමේ ව්‍යවස්ථාපිත විගණනය සිදු කරන ලෙස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔබගේ ආයතනයෙන් ඉල්ලීම් කර ඇත. සමාගමේ පෙර විගණන ආයතනය වන XYX විගණනය ප්‍රතික්ෂේප කර ඒ බව සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව දන්වා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

I. ඔබ විගණන සේවා දායකයෙකු ලෙස මිහිරි කේක් සහ රසකැවිලි ආයතනයේ විගණනය භාර ගැනීමට පෙර සලකා බැලිය යුතු කරුණු කවරේද? (ලකුණු 04)

II. සේවයේ යෙදවීමේ ලිපිය I අන්තර්ගත විය යුතු කරුණු ලියන්න. (ලකුණු 03)

III. ආයතනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට විගණනවරයාට සිදු කළ හැකි ක්‍රියාකාරකම් තුනක් (03) හා හඳුනාගන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

JMC vLearning
"your virtual learning partner"

## 07 වන ප්‍රශ්නය

**සුමාල් රෝසි ඇසෝසියේට්** විගණන ආයතනයේ විගණන ජ්‍යෙෂ්ඨයෙකු වන අතර ඔහු සීමාසහිත White Rose සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව ව්‍යවස්ථාපිත විගණනය සැලසුම් කරමින් සිටින අග තොගයට අදාල විගණන සැලසුමෙන් හා විගණන වැඩ පත්‍රිකා වලින් උපුටා ගන්නා ලද සංෂිප්තයන් පහත සඳහන් පරිදිය.

1. අග තොගය තුළ පවතින ඇතැම් අයිතමයන් විශාල මිල ගණන් යටතේ මිලදී ගත් කල් ඉකුත් වී ඇති තොග ද පවතී.
2. ව්‍යාපාරයේ තොග පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය එතරම් ශක්තිමත් නැති බව අනාවරණය කර ගන්නා ලදී.
3. තොග මිලදී ගැනීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර නැතැයි සොයා ගන්නා ලදී.
4. ගබඩා පාලකයකු නොමැති අතර, සහකාර මුදල් කළමනාකරු විසින් ගබඩාවේ කටයුතු සොයා බලනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

I. තොග කළමනාකරණ ක්‍රියාවලිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ලබා දිය හැකි උපදෙස් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

II. තොග මිලට අමතරව ව්‍යාපාරයක පවතින අනෙකුත් අවධාරණයට ගත් යුතු අංශ කවරේද? (ලකුණු 04)

(මුළු ලකුණු 10)

B කොටසේ අවසානය

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත Rio පුද්ගලික** සමාගම දේශීය වෙළෙඳපොළ සඳහා **අයිස්ක්‍රීම්** නිෂ්පාදනයේ යෙදී සිටී සමාගම යාපනය දිස්ත්‍රික්කයට පමණක් සීමාවන අතර කොළඹ මහනුවර හා අනුරාධපුර යන නගරවල සිය මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අවධානය යොමු කරමින් සිටී. දැනට ආයතනයේ යාපනය දිස්ත්‍රික්කය ප්‍රධාන කොටගත් උතුරු පළාත්ට සිය නිෂ්පාදන බෙදා හැරීම සඳහා සමාගමේ සෘජු බෙදාහැරීම් සඳහා ලොරි රථ 50 ක ප්‍රමාණයක් පවතින බවත් අනෙකුත් දිස්ත්‍රික්ක (කොළඹ, මහනුවර,අනුරාධපුර) සඳහා බෙදාහැරීමේ නියෝජිතයන් සොයාගැනීම පිළිබඳ සලකා බලමින් සිටී. කෙසේවුවද ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් Rio සමාගම සතු නොවේ.

- ගිණුම්කරණය හා මූල්‍ය වාර්තා වාර්තාකරණය පිළිබඳ එතරම් අවබෝධයක් නොමැති සමාගමේ අයිතිකරුගේ බිරිඳගේ සහෝදරයා විසින් ඇනවුම් භාර ගැනීම, Invoice කිරීම, මුදල් භාර කටයුතු කිරීම කර්මාන්තශාලා අධීක්ෂණය කිරීම යන කටයුතු සිදුකරනු ලබයි.

- මෙහි කළමනාකරණයේ අධ්‍යක්ෂක විසින් ව්‍යාපාරය අභ්‍යන්තර පාලනය පිළිබඳ තක්සේරුවක් සිදු කරන මෙන් ඔබගේ වෘත්තිය ගිනුම්කරණ ආයතන ඉල්ලීමක් කර ඇත. මෙම කාර්යයභාර ඔබ ගිණුම්කරණ ආයතනයේ විගණන හවුල්කරු විසින් පහත තොරතුරු ඉදිරිපත් කර තිබේ.

✓ සමාගම විසින් පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සිදු කර නොමැති බවත්, පොතක විකුණුම් හා ඊට අදාල විස්තර, ණයට විකුණුම් හා මුදල් ලැබීම් වලට අදාල තොරතුරු වාර්තා කොට ඇත.

✓ ද්‍රව්‍ය මිලදී ගැනීම්, වැටුප් ගෙවීම් ඊට අදාළ ලියකියවිලි ක්‍රමානුකූලව නඩත්තු නොවන අතර සේවකයන්ට දෛනික පැමිණීම මත මාස්පතා වැටුප් ගෙවයි.

✓ ශ්‍රමයට සරිලන පරිදි වැටුප් නොගෙවන බැවන් සමාගමේ සේවක පිරිවැටුප ඉහළ තත්ත්වයක පවතී.

✓ සේවාදායකයා සමග සාකච්ඡාවේ දී මෙහි කාර්යභාරය හවුල්කරු කළමනාකරණ කළ අධ්‍යක්ෂකවරයාට නිසි වාර්තා පවත්වා ගැනීමේ වැදගත්කම අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කොට ව්‍යාපාරික ක්‍රියාවලි ක්‍රමවත්ව පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කර දුන් අතර ඒ සඳහා සිය ආයතනයට සහයෝගයක් දෙන මෙන් කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ඔබ ආයතනයෙන් ඉල්ලා සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

I. අභ්‍යන්තර පාලන පද්ධතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)
II. අභ්‍යන්තර පාලන පද්ධතිය අරමුණු කවරේද? (ලකුණු 03)
III. Rio පුද්ගලික සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රධාන දුර්වලතා කවරේද? (ලකුණු 04)
IV. සමාගමේ මුදල් කළමනාකරණ ක්‍රියාවලිය යථා තත්ත්වයට පත් කරමින් විධිමත් ආකාරයට පවත්වාගෙන යාම සම්බන්ධව උපදෙස් සපයන්න. (ලකුණු 06)
V. Rio පුද්ගලික සමාගමට අදාළව හඳුනාගත හැකි මුදල් කළමනාකරණ ක්‍රියාවලිය හැර ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලි නම් කරන්න. (ලකුණු 04)

❖ සමාගමකට හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් පැවතීමෙන් වංචා හා වැරදි සිදුවීමේ අවධානම සියයට සීයක් ඉවත් කළ හැකිද? යන්න කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ඔබෙන් විමසා සිටී.

1. ඉහත ප්‍රකාශය විමසන්න. (ලකුණු 02)
2. අභ්‍යන්තර පාලන පද්ධතියක පවතින ආවේණික සීමා පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

JMC vLearning "your virtual learning partner"

## 09 වන ප්‍රශ්නය

සමස්ත නිෂ්පාදනයම යුරෝපා වෙළෙඳපොළට අපනයනය කිරීම සඳහා කාබනික පලතුරු නිෂ්පාදන සිලෝන් ඕගනික් ෆෲට්ස් යෙදී සිටින සමාගමේ ව්‍යවස්ථාපිත විගණනය භාර ජොෂ්ඨ සාමාජිකයා ඔබ වේ. විගණන කාර්යභාරය සම්බන්ධ පහත තොරතුරු **2021 මාර්තු 31** දිනෙන් අවසන් මූල වර්ෂය සඳහා ඔබේ විගණන ශ්‍රේෂ්ඨයා වන මලීෂ පිළියෙල කරන ලද විගණන පත්‍රිකා ද සහ විගණන සැලසුම් ලියවිල්ලෙන් උපුටා ගන්නා ලදී.

1. සමාගමේ **අධ්‍යක්ෂවරයා සුසිල් පීරිස්** වන අතර ඔහුට හිමිකාරීත්වයෙන් (60%) ක ප්‍රතිශතයක් හිමිය.

2. තමාලී පීරිස් අධ්‍යක්ෂක සුනිල් පීරිස් ගේ බිරිඳ වන අතර ඇයට 40% ක ප්‍රතිශතයක් හිමිය.

3. වර්ෂය තුළ දී Coff සමාගමට අළුතින් කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකු බඳවා ගත් අතර සෝනි සුසිල් පීරිස් විසින් සිය බිරිඳ දික්කසාද කොට ඇයගේ 40% ලබා ගන්නා ලදී .

4. සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම් මිලියන දෙසීයක ණයක් කොවිඩ් පහසුකම් යටතේ රාජ්‍ය බැංකුවකින් ලබාගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ අලුත් මුහුණුවරකින් පාරිභෝගිකයන් වෙත නිෂ්පාදිත අලෙවි කිරීමට, සිය වෙළඳපොල කොටස පුළුල් කර ගන්නා ලදී. නමුත් කොවිඩ් නිසා සමස්ත අලෙවිය 15% කින් පහළ බැස ඇත.

5. පසුගිය වර්ෂයට සාපේක්ෂව Covid 19 වසංගතය නිසා සමාගමේ ලාභාන්තිකය 10% කින් අඩුවිය. එය 25% ක පෙර පැවති ලාභයෙන් පහත බැසීමකි.

6. සිය කළමනාකරණ අධ්‍යක්ෂක වෙත රුපියල් 300,000 ක මාසික වැටුපට අමතරව වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ද ගෙවා ඇත.

7. පසුගිය වසර සඳහා යොදාගත් සේවයේ යෙදවීමේ ලිපිය මෙම වසරේ විගණනය සඳහා ද යොදාගෙන ඇති අතර සමාගමේ විකුණුම් සහ මිලදී ගැනීම් පටිපාටිය වංචා සහගත ලෙස තම පෙරේරා මහත්මිය විසින් සිදු කර ගෙන ගොස් ඇති බවට අනුමාන කරයි. එමෙන්ම එය තහවුරු කර දෙන මෙන් ඔබගෙන් ඉල්ලා සිටී.

**ඔබ විසින් කළ යුතු දේ:**

**A.**

I. Coff සමාගමේ විගණන පටිපාටි ඉටු කිරීමේදී ඔබ විසින් අවධානය යොමු කළ යුතු ශ්‍රේෂ්ත්‍ර හතරක් (04) හඳුනාගන්න. (ලකුණු 04)

II. සේවයේ යෙදවීමේ ලිපියක අන්තර්ගත කරන ලද කරුණු කවරේද? ඉහත අවස්ථාවට අදාළව ඉදිරිපත් කළ යුතු සංශෝධන කවරේද? (ලකුණු 04)

JMC vLearning "your virtual learning partner"

III. අවදානම් තක්සේරු කරන ක්‍රියාපටිපාටිය යටතේ හඳුනාගත හැකි අවදානම් ප්‍රදේශ අදාළව කවරේද? (ලකුණු 05)

IV. Coff සමාගමේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම පිළිගත යුතුද පිළිගන්නේ නම් කඩවන වෘත්තීය ආචාර ධර්ම කවරේද? විමසන්න. (ලකුණු 06)

**B.** වෘත්තීය විගණකවරයෙකු සිය වෘත්තිය ආචාර ධර්මවලට අනුකූලව පරිච්ඡේදයේ යෙදිය යුතු වේ. එහිදී වෘත්තිය දෘෂ්ඨියකින් කටයුතු කිරීම් අතිශය වැදගත් කාර්යභාරයකි.

I. වෘත්තිකයෙකු අනුගමනය කළේ යුතු වෘත්තිය ආචාරධර්ම කවරේද? ඒවා කෙටියෙන් විමසන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 25)

C කොටසේ අවසානය

JMC vLearning "your virtual learning partner"